ජනාධිපතිවරණ උණුසුමෙන් මෙරට දේශපාලන පොරපිටිය ගිනියම් වී ඇති මොහොතක අමාත්‍ය මිලින්ද මොරගොඩ, එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර අමාත්‍ය රාජිත සේනාරත්න, ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති දක්වන අදහස් මෙසේ පෙළ ගැසෙයි.

"දේශපාලන පක්ෂ ළං කරගත් පමණින් ජනතා විශ්වාසය දිනන්න බෑ"



අධිකරණ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ

ප්‍ර : ජනාධිපතිවරණයට තවත් ඇත්තේ දෙසතියකටත් අඩු කාලයක්. මේ වන විට දේශපාලන කරළිය ඉතාම උණුසුම්. දෙපාර්ශ්වයම මේ සටනින් ජය ගැනීමට අති විශාල පරිශ්‍රමයක් දරන බව පෙනෙනවා. මේ දේශපාලන වාතාවරණය ගැන ඔබට තිබෙන "කියැවීම" කවරාකාරණ එකක්ද?

පි : මේ ජනාධිපතිවරණයට අපි පැමිණ සිටින්නේ අවුරුදු 30 ක් තිස්සේ පැවැති යුද්ධයක් අවසන් කිරීමෙන් පසුවයි. එම නිසා මෙය එක්තරා විදියක සන්ධිස්ථානයක් වශයෙන් හැඳින්විය හැකියි. මට හිතෙන්නේ මේ අවස්ථාවේ මීට වඩා රට තුළ ප්‍රතිපත්තිමය සංවාදයක් තිබුණා නම් හොඳයි කියලයි. පටු වාද භේද, මඩගැසීම්, චරිත ඝාතන වැනි දේට යන්නේ නැතිව මෙයට වඩා හරවත්, බුද්ධිමය සංවාදයක් මේ අවස්ථාවේ ගොඩනැගෙනවා නම් යහපත් යැයි මා විශ්වාස කරනවා. අවුරුදු 30 ක් තිස්සේ පැවතුණු යුද්ධයත් සමග අපේ සමාජය බොහෝම නපුරු සමාජයක් බවට පරිවර්තනය වුණා. ඒ වගේම අපේ දේශපාලන සංස්කෘතියත් ඒ පැත්තට පෙරළුණා. දැන් අපි මේ තත්ත්වයෙන් එළියට ආ යුතු කාලය එළැඹිලයි තියෙන්නේ.

ප්‍ර : ඔබ කෙටි කලකට කලින් " ශ්‍රී ලංකා ජාතික සංගමය" නමින් ඔබේම දේශපාලන පක්ෂයක් ආරම්භ කළා. ඔබේ දේශපාලන පක්ෂයෙන් ඔබටත් රටටත් සැදෙන සෙත, මොකක්ද?

පි : මම දේශපාලනයට පිවිසි කාලයේ පටන් නොයෙක් අවස්ථාවල අපේක්ෂා කළේ අපේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්නයි මට වුවමනා කළේ. පෝස්ටර් කටවුට් ආදිය නැතිව මගේ ඡන්ද ව්‍යාපාරය දියත් කිරීම, එය එක සංකේතයක් විතරයි.

ශ්‍රී ලංකා ජාතික සංගමය මුල්වරට බිහි වුණේ 1919 වර්ෂයේදී. එය බිහි වුණේ ඒ යුගයේ පැවැති ජාතික අවශ්‍යතාවක් වෙනුවෙන්. එයට දේශපාලන පක්ෂ භේදයක්, ජාති භේදයක් හෝ කුලභේදයක් තිබුණේ නැහැ. දැනට ලංකාවේ තිබෙන දේශපාලන සංස්කෘතිය වෙනස් විය යුතුය. මෙය අලුත් මොහොතක්. මේ අලුත් මොහොතේ, එම ජාතික වගකීම ඉෂ්ට කරන්නයි අපි අපේක්ෂා කරන්නේ. මම හිතන්නේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සංකල්ප තුළ මේ විදියේ අනනාතාවකට ඉඩක් තිබෙනවා.

ශ්‍රී ලංකා ජාතික සංගමය ඉදිරිපත් වන්නේ මේ යුගයට ගැළපෙන දර්ශනය ඉදිරිපත් කරන්නයි. සිරිසේන කුරේ, ආර්. ඒ. ඩී. සිරිසේන වැනි මහත්වරුන් මෙයට සම්බන්ධ වෙලා සිටිනවා. සිංහල, දෙමළ, මුස්ලිම් ආදී සියලුම ජන කොටස් ශ්‍රී ලංකා ජාතික සංගමය තුළ නියෝජනය වෙනවා.

තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීමේ පනත, විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය ලබා දීම, වැඩිහිටියන්ට සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට තිබෙන ප්‍රශ්න නිරාකරණය කර ගැනීම වැනි කාරණා වෙනුවෙන් අපි මැදිහත් වෙනවා. ශ්‍රී ලංකා ජාතික සංගමය යනු පවු දේශපාලන අරමුණු ඇතුළේ ක්‍රියාත්මක වන දේශපාලන ව්‍යාපාරයක් නෙවෙයි. එය ඉතාමත් පැහැදිලිවම අවධාරණය කළ යුතුයි.

ප්‍ර : වර්තමානයේ ක්‍රියාත්මක වන "බල දේශපාලනය" ඇතුළේ ඔබ ඔය කියන දේවල් උඩුගං බලා පිහිනීමක් නෙවෝද්ද? මේ ජවනින ක්‍රමය ඇළ ඔබ හුදෙකලා වන්නේ නැද්ද?

පි: මට හුදෙකලා වීම කියන එක අමුතු දෙයක් නෙවෙයි. මට තනිවෙලා දේශපාලනයේ යෙදිලා හොඳට හුරුයි. මම නම් හිතන්නේ "බලය" කියන්නේ ජනතා විශ්වාසයට. කෙටි කාලයක දී මෙය අමාරු දෙයක් වෙන්න පුළුවන්. නමුත් දිගුකාලීනව එය යහපත් ප්‍රතිඵල අත් කර දෙන දෙයක් බවයි මම විශ්වාස කරන්නේ. කොහොම නමුත් අපි අපේ අදහස් ජනතාවට ඉදිරිපත් කරනවා. අපට ජනතාව ගැන විශ්වාසයක් තියෙනවා.

ප්‍ර : අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් මේ වන විට එල්ටීටීඊ ග්‍රහණයේ සිටි ළමුන් පුනරුත්ථාපනය කොට වැඩදායී පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර තිබෙනවා. මේ වන විට එහි වැඩකටයුතු කෙරෙන්නේ කොයි විදියටද?

පි : මම හිතන්නේ ඒ කටයුතු බොහෝම සාර්ථකයි. මම මේ අමාත්‍යාංශය භාර අරන් මාස කිහිපයක් පමණයි ගතවෙලා තියෙන්නේ. ඒ කාලය තුළ සාර්ථකව වැඩ කටයුතු සිද්ධ වුණා කියලා මට හිතෙනවා. මේක තනියම කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. කණ්ඩායම් වැඩක ප්‍රතිඵලයක්. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්තුමාත් මෙයට විශාල සහයෝගයක් දක්වනවා. ඒ විතරක් නොවෙයි දෙමළ සමාජයේ විශ්වාසයත් අපි මෙයට දිනාගත යුතුයි. එම නිසා අපි මෙයට විදේශගතව සිටින ද්‍රවිඩ ජනතාවගේ සහයෝගයත් ලබා ගත්තා. ඒ වගේම අන්තර්ජාතික ප්‍රජාවෙත්, පුද්ගලික අංශයෙත් සහයෝගය ලබා ගත්තා. එල්ටීටීඊ සංවිධානයේ ළමා සොල්දාදුවන් වශයෙන් සිටි දරුවන් දෙසිය ගණනක් දැන් රත්මලාන හින්දු විද්‍යාලයේ අධ්‍යාපනය ලබනවා. ඔවුන් සාමාන්‍ය සිසුන් වගේම අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගවලට මුහුණ දීමේ අරමුණින් අධ්‍යාපනය කරගෙන යනවා. ඒ වගේම වෘත්තිය අධ්‍යාපනය ලබන්න කැමැති දරුවන්ටත් වවුනියාවේ පුන්තෝට්ටම් හි පිහිටි මධ්‍යස්ථානයේ දී ඒ අවස්ථාව සලසලා දී තිබෙනවා. යුනිසෙෆ්, අයි.ඕ.එම්. වගේ සංවිධාන මේ කාර්යයේ දී අපට අති විශාල සහයෝගයක් දක්වනවා.

මේ ක්‍රියාවලිය ඇතුළේ දේශපාලනය නැහැ. දේශපාලනය මෙයට ඇතුළත් කර ගන්න අප බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. ඒ වගේම අනෙක් පැත්තෙන් මේක ලෙහෙසි දෙයකුත් නෙවෙයි. ආරක්ෂාව සම්බන්ධ විධි විධාන ගැනත් අපි අවධානය යොමු කළ යුතුයි. එතැන දී ආරක්ෂක ලේකම්තුමා මේ වැඩපිළිවෙළට දක්වන සහයෝගයත් විශේෂයෙන්ම අගය කළ යුතුයි. හේතුව එක පුංචි තැනක හරි වරදකට ඉඩක් තිබුණොත්, මේ සමස්ත ක්‍රියාවලිය ගැනම ජනතාවගේ අවිශ්වාසයක් සහ අප්‍රසාදයක් ගොඩනැගෙන්න ඉඩ තිබෙනවා. අපි ඒක හොඳින් අවබෝධ කරගෙනයි ඉන්නේ.

ප්‍ර : එනකොට පසුගිය දා ඔබේ අමාත්‍යාංශයෙන් ආරම්භ කළ "පුරනැගුම" වැඩසටහන ගැනත් කිසියම් පැහැදිලි කිරීමක් කළොත්...?

පි : මම විශ්වාස කරන දෙයක් තමයි බන්ධනාගාරය කියන්නේ සමාජයේ කැඩපත කියන එක. නමුත් බන්ධනාගාරය සහ සමාජය අතර විශාල දරස්ථ බවක් තියෙන්නේ. මේ වැඩපිළිවෙළේ දර්ශනය තමයි, මේ දෙක එකට එක් කරලීම. මේ වැඩසටහන යටතේ බන්ධනාගාර රැඳවියන්ටත්, සමාජ සංවර්ධනයට දායක වෙන්න අවස්ථාව සලසා දෙනවා. නිදර්ශනයක් වශයෙන් මාළිගාවත්ත ඇළ දිගේ නිවාස සංකීර්ණයක් තියෙනවා. පන්සලක්, පල්ලියක්, කෝවිලක්, මුස්ලිම් පල්ලියක් ආදී වශයෙන් ආගමික සිද්ධස්ථානත් තියෙනවා. මේ ආගමික සිද්ධස්ථානවල මූලිකත්වයෙන් ශ්‍රමදාන සංවිධානය කර අපට පුළුවන් බන්ධනාගාර රැඳවියන්වත් එයට සම්බන්ධ කරවන්න. ඒ වගේම "ප්‍රජා ශෝධන" වැඩත් අපි මෙයටම සම්බන්ධ කරනවා. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය දැනුවත් කිරීම් මේ දිනවල කරගෙන යනවා.

ප්‍ර : අපි නැවත වත්මන් දේශපාලනය පැත්තට අවතීර්ණ වෙමු. පසුගිය දා ජනාධිපතිතුමාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය එළිදැක්වුවා. සමස්තයක් වශයෙන් ගත්තම විපක්ෂයේ පොදු අපේක්ෂකයාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ඇති ආකර්ෂණීය පොරොන්දුවලට සමගාමී දේවල් "මහින්ද චින්තන"ය ඇතුළේ දකින්න ලැබෙන්නේ නැහැ. ඒ ගැන ඔබේ මතය?

පි : ජනාධිපතිතුමා පැහැදිලිවම ප්‍රකාශ කරන කාරණයක් තමයි පොරොන්දු දේශපාලන යුගය අවසන් කළ යුතු බව. ලී ක්වාන් යූ මහතා කියූ පරිදි ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ කාලෙන් කාලෙට, වාරෙන් වාරෙට නැති සම්පත් වෙන්දේසි කිරීම. මේ දෙන පොරොන්දු ඉෂ්ට කළොත් ආර්ථිකය කඩා වැටෙනවා. ඒවා ඉෂ්ට නොකළොත් ජනතාවගේ විශ්වාසය කැඩෙනවා. ඒ නිසයි අපි ඒ ක්‍රමය අවසන් කළ යුත්තේ. ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය දෙස බැලුවම පෙනෙන දෙයක් තමයි එය ඉතාම පුළුල් බව. පැහැදිලි දර්ශනයක් මෙන්ම ප්‍රායෝගික වැඩපිළිවෙළකුත් එය ඇතුළේ තියෙනවා.

ප්‍ර : ද්‍රවිඩ ජාතික සන්ධානය මුස්ලිම් කොංග්‍රසය ඇතුළු සුළු ජාතික දේශපාලන පක්ෂවලින් බහුතරයක්, ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාට සහාය දක්වන වාතාවරණයක් තුළ ඉදිරි ජනාධිපතිවරණයේ ප්‍රතිඵලය ගැන ඔබට තියෙන්නේ කවරාකාර අනුමානයක්ද?

පි : අවංකවම කිව්වොත් මම හිතන්නේ නැහැ එක් එක් දේශපාලන පක්ෂ ළං කර ගත් පමණින් ඒ ඒ ජනකොටස්වල විශ්වාසය දිනා ගන්න පුළුවන් වෙයි කියලා. ඉතින් ඔය කියන තර්කය කොයිතරම් දුරට සාධාරණ එකක්ද කියලා 26 වැනිදායින් පස්සේ අපි කාටත් දැනගන්න පුළුවන් වෙයි. ඒ කොහොම වුණත් මා තරයේ විශ්වාස කරන කාරණය වන්නේ අන්තවාදයෙන් තොර මැද මාවත ශක්තිමත් කරන්න දෙපක්ෂයම උත්සාහ ගත යුතු බවයි. අන්තවාදයට යට වුණොත් එයින් කිසිවකුටත් කිසිම විදියක යහපතක් වන්නේ නැහැ.

රසික ජයකොඩි
ඡායාරූපය-චතුර එස්. කොඩිකාර